# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි තෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය 2021/2022

# SLG 3158 – සිංහල නාට්‍ය කලාව

(පැ දෙකයි)

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් බැගින් වත් තෝරා ගෙන ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

### පළමු කොටස

1. "කිසියම් නාට්‍ය නිර්මාණයක සාහිත්‍යික කාර්යයභාරය රචකයා වෙත පැවරෙන අතර එය ප්‍රේක්ෂකයා වෙත රැගෙන යාමේ වගකීම පැවරෙනුයේ නළු නිළියන්ට ය." මෙම අදහස පැහැදිලි කරන්න.

2. "අභිචාරාර්ථයක් ගැබ් ව තිබුණ ද අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් ඉදිරිපත් කිරීම නිසා 'සොකරි' ගැමි නාට්‍ය කලාව තුළ වැදගත්කමක් උසුලයි." විමසන්න.

3. නූතන සිංහල නාට්‍ය කලාවෙහි ප්‍රභවය සඳහා 1930-1940 දශකවල නිර්මාණය වූ 'විශ්වවිද්‍යාල නාට්‍යවලින්' ලැබුණු දායකත්වය සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

### දෙවන කොටස

4. නාට්‍යයක ජීව ගුණය කෙරෙහි නාට්‍යෝචිත අවස්ථා වැදගත් වන්නේ ඇයි ද යන්න 'මනමේ' නාටකයෙහි තෝරාගත් අවස්ථා ඇසුරින් විමසන්න.

5. "නාට්‍ය ආරම්භයේ දී මුඛ්‍ය චරිතවලින් පිළිබිඹු වන ලක්ෂණ නාට්‍ය වස්තුවේ ක්‍රමික විකාශනයේ දී වෙනස් වීමකට ලක්වීම සුබ සහ යස නාට්‍යයෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණකි". ඉහත අදහසට පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වමින් විමසන්න.

6. "තීරණාත්මක අවස්ථාවල දී මිනිස් සිතෙහි ආත්මාර්ථයත් පරාර්ථයත් වරින් වර ඉස්මතු වන ආකාරය **හුණුවටයේ කතාවෙහි** නිරූපිත ය". හුණුවටයේ කතාව නාට්‍යයෙහි පළමු කොටස ඇසුරින් විමසන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (2) ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    1. නාට්‍ය ප්‍රේක්ෂකයා
    2. සාත්ත්වික අභිනය
    3. තදාත්ම විසටනය (alienation effect)
    4. 60 දශකයේ සිංහල නාට්‍ය